| මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| තෙවන වාර පරීක්ෂණය - 2018 | | |
| නාට්‍ය හා රංගකලාව I | 12 ශ්‍රේණිය | කාලය පැය තුනකි |

නම: ..............................................................

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ඉතා නිවැරදි පිළිතුරට අදාළ අංකය ඉදිරියෙහි ඇති වරහන තුළ යොදන්න.**

1) නාට්‍යයක අත්‍යවශ්‍යම අංගත්‍රයන් වේ.

   i. පෙළ, අධ්‍යක්ෂක, නිෂ්පාදක.
   ii. නළුවා, අංගරචනය, වෙස් මෝස්තර.
   iii. පෙළ, නළුවා, ප්‍රේක්ෂකයා.
   iv. නළුවා, අංගරචනය, පොතේගුරු.
   v. පෙළ, පොතේගුරු, ගායක පිරිස. (...............)

2) සාර්ථක නාට්‍ය රචකයකු වීමට අත්‍යවශ්‍ය මූලික ලක්ෂණ හා ගුණාංග නොවන්නේ,

   i. අපූර්වතම වස්තු නිර්මාණය කළ හැකි ප්‍රඥාව.
   ii. සතත අභ්‍යාසය.
   iii. රූපණ කුසලතාව.
   iv. පරිකල්පන ශක්තිය.
   v. ජීවන අත්දැකීම්. (...............)

3) ග්‍රීක නාට්‍ය කලාව සඳහා තෙවන නළුවා හඳුන්වා දුන්නේ,

   i. ඇරිස්ටොෆානීස්ය. ii. දියෝනීසස්ය. iii. සොෆක්ලීස්ය.
   iv. යුරිපිඩීස්ය. iv. තෙස්පීස්ය. (...............)

4) නාට්‍ය දර්ශනයක මූලික ලක්ෂණය සඳහා නොගැළපෙන වරණය වනුයේ.

   i. නළුවන් විසින් භාවිත කරන නාට්‍යය පෙළක් තිබීම.
   ii. සජීවීව ඉදිරිපත් කිරීමක් තිබීම.
   iii. විශාල ශිල්පී සහභාගීත්වයක් අවශ්‍ය වීම.
   iv. සමාජයකට වැදගත් පණිවිඩයක් හා රසයක් ලබාදීම.
   v. ඒ සඳහා ම රැස් වූ ප්‍රේක්ෂක පිරිසක් සිටීම. (...............)

5) ''ඔපෙරාව'' සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර වන්නේ,

i. හංසවිල ඔපෙරාවකි.

ii. ඔපෙරාවෙහි සංගීතය ප්‍රමුඛ නොවේ.

iii. චීනයේ මෙන්ම ඉතාලියේ ද ජනප්‍රිය කලාවකි.

iv. කතා වස්තුවක් අන්තර්ගත නොවේ.

v. වර්තමානයේ භාවිතයේ නැත. (...............)

6) ගීත නාටක සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. ගායනයට විනා රංගනයට ප්‍රමුඛත්වය නොදේ.

ii. පෙරදිග ගීත නාටක බටහිර ඔපෙරාවේ ආභාසය ලබා නැත.

iii. කතා වස්තුවක් පදනම් ව ගොඩනැගෙන්නේ නැත.

iv. මනමේ ගීත නාටකයකි. (...............)

v. ''දෙපානෝ'' ගීත නාටකය ඩබ්.බී. මකුලොළුව මහතාගේ නිර්මාණයකි.

7) රසිකයන් යන්නට නිවැරදි අර්ථකථනය වන්නේ,

i. ඕනෑම ප්‍රේක්ෂකයෙකු හඳුන්වන නාමයයි.

ii. උසස් නිර්මාණයක් කිරීමට සමත් කලාකරුවාය.

iii. ප්‍රතිභා හා ව්‍යුත්පත්ති ශක්තීන්ගෙන් යුක්ත වූවකි.

iv. නාට්‍යක් නිවැරදිව ඉදිරිපත් කරන්නාය.

v. සහෘදයා යන්නට සමාන අර්ථයක් ගෙන දෙන්නකි. (...............)

8) ඉපැරණි ග්‍රීක භක්ති ගීත රචකයාගේ නම,

iii. ඊස්කිලස්. ii. ඇරිස්ටොෆානිස්. iii. එරියොන්

iv. තෙස්පිස්. v. මිරැන්ඩ. (...............)

9) ''දැක්කොත් පද්මාවතී ආලෙ..'' හා ''සෝබමාන දේව පුරා..'' ගීත අයත් නූර්තිය වන්නේ,

i. ස්වර්ණතිලකා නූර්තියේය.

ii. දිනකර නූර්තියේය.

iii. ෂූලා නූර්තියේය.

iv. පද්මාවතී නූර්තියේය.

v. සුදාස සාලිනි නූර්තියේය. (...............)

10) ආහාර්ය අභිනයට අයත් අංග පමණක් අන්තර්ගත පිළිතුර තෝරන්න.

i. නාට්‍ය පෙළ, රංගනය, නාට්‍ය සංගීතය.

ii. රංගනය, පසුතලය, සංගීතය, නාට්‍යපෙළ.

iii. කටහඬ, රංගවස්ත්‍ර, රංග ආභරණථ පසුතල නිර්මාණ.

iv. අංග රචනය, පසුතල නිර්මාණ, රංග වස්ත්‍රාභරණ, රූපණය.

v. රංගවස්ත්‍රාභරණ, අංගරචනය, පසුතල නිර්මාණ, රංග භාණ්ඩ. (...............)

11) සාර්ථක නාට්‍ය රචකයකු උත්සහ දරන්නේ,

i. චරිතය මඟින් සම්පූර්ණ කතාව කීමටය.

ii. චරිත කීපයක් යොදා කතාන්දරයක් ඉදිරිපත් කිරීමටය.

iii. නාට්‍යමය අවස්ථා මඟින් කථාවස්තුවක් ගෙනහැර පෑමටය.

iv. කතාන්දරය සංවාද මඟින් ඉදිරිපත් කිරීමට ය.

v. සංවාද මඟින් චරිත කීපයක් නිරූපණය කිරීමටය. (...............)

12) ''නාට්‍ය යනු ලෝකයාගේ පැවැත්ම අනුකරණය කිරීමකි'' යන අදහස ඉදිරිපත් කලේ,

i. ඇරිස්ටෝටල්ය.

ii. ධනංජය පඬිතුමාය.

iii. අකුල ඩයස් නිකොල්ය.

iv. බර්නාට් ෂෝය.

v. භරතමුණි ය. (...............)

13) අධ්‍යක්‍ෂකවරයා යනු,

A. සොඳුරු ආඥාදායකයෙකි.

B. මංගල දර්ශනයෙදීත් සියලු කාර්ය භාර්ය කරට ගනී.

C. වේදිකාවේ නාට්‍යය දර්ශනය ආරම්භවූ මොහොතේ සිට දර්ශනය අවසාන වන තෙක්ම වේදිකාවේ සිටිමින් කටයුතු කරයි.

D. නළු නිළි වරණය සිදුකරයි.

i. AC සත්‍ය වන අතර BD අසත්‍ය වේ.

ii. AD සත්‍ය වන අතර BC අසත්‍ය වේ.

iii. BD සත්‍ය වන අතර AC අසත්‍ය වේ.

iv. DC සත්‍ය වන අතර AD අසත්‍ය වේ.

v. AB සත්‍ය වන අතර DC අසත්‍ය වේ. (...............)

14) භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි ඇතුළත් නොවන රසය හා භාවය කුමක්ද?

i. රති, ශෘංගාරය.
ii. ශෝක, කරුණා.
iii. ශාන්ත, ශාන්ත
iv. විශ්මය, අද්භූත
v. භය, භයානක.

(...............)

15) ටෙලි නාට්‍යට අදාළ නොවන වරණය තෝරන්න.

i. සජීවී කලා මාධ්‍යක් නොවේ.

ii. සංස්කරණය ඉතා වැදගත් තැනක් දරයි.

iii. එකම කතාව කොටස් වශයෙන් ප්‍රදර්ශනය කළ හැක.

iv. ප්‍රේක්‍ෂකයන් හා සජීවීව සම්බන්ධ නොවේ.

v. සියලුම දර්ශන කාලානුරූපී රූගත කිරීම අතිශය වැදගත්ය. (...............)

16) සොඳුරු ආඥාදායකයා යනු,

i. නාට්‍ය අධ්‍යක්ෂවරයා.
ii. වේදිකා පාලක.
iii. නළුවාය.
iv. නාට්‍ය රචකයාය.
v. අර්ථපතිය.

(...............)

17) මනමේ හා සිංහබාහු යන නාට්‍ය නිර්මාණය කල වර්ෂය පිළිවෙලින්,

i. 1961 හා 1956
ii. 1952 හා 1956
iii. 1958 හා 1964
iv. 1956 හා 1961
v. 1961 හා 1955

(...............)

18) නාට්‍යයක මුදල් හා සම්බන්ධ කටයුතු මෙහෙයවන පුද්ගලයා වන්නේ,

i. රචකයා.
ii. සංවිධායක පිරිස.
iii. වේදිකා පාලක.
iv. නාට්‍ය අධ්‍යක්ෂක.
v. අර්ථපති (...............)

19) ප්‍රක්ශේපණීය මාධ්‍යයක් වන සිනමාවට අදාළ නොවන වරණය,

i. ශ්‍රව්‍ය දෘශ්‍ය කලා මාධ්‍යයක්.
ii. රූපරාමු දුරස්ථ හා මධ්‍යස්ථ, සමීපස්ථ වශයෙන් ඉදිරිපත් කළ හැකිය.
iii. නළු නිළියන් කථාවේ එන සියලුම දෙබස් වන පොත් කරගෙන සිටීම අවශ්‍ය නොවේ.
iv. ප්‍රේක්ෂක ප්‍රතිචාර සජීවීව ලැබෙයි.
v. කලින් නිර්මාණය කර ගබඩා කර තැබිය හැකි කලා මාධ්‍යයකි. (...............)

20) ප්‍රේක්ෂාව යනු,

i. ප්‍රේක්ෂකාගාරයට කියන නමකි.
ii. ප්‍රේක්ෂකයාට කියන නමකි.
iii. ප්‍රේක්ෂකයා ඉදිරියේ මොහොතින් මොහොත මැවෙන දර්ශනයකි.
iv. ප්‍රේක්ෂකයා සඳහා වෙන් කල කොටසකි.
v. ප්‍රේක්ෂකයා සුවිශේෂ ස්ථානයක් හඳුන්වන නමකි. (...............)

21). සාර්ථක නාට්‍ය රචකයකු උත්සහ දරන්නේ,

i. මුදල් ඉපයීමේ අරමුණින්ය.
ii. නාට්‍ය කලාව තුළ නව මංපෙත් සොයමින් ප්‍රේක්ෂකයා පිනවීමටය.
iii. කාලය ගෙවා ගැනීමේ මාධ්‍යයක් වශයෙනි.
iv. ප්‍රේක්ෂක ඉල්ලීම මත.
v. ජන නායකයන්ගේ ඉල්ලීම වීම. (...............)

22)නාට්‍යෝචිත අවස්ථාවක ඇතුළත් ලක්ෂණයක් වන්නේ,

i. භාව උද්දීපනය.

ii. කුතුහලය.

iii. නිශ්චිත බව.

iv. භාව සමනය.

v. විශ්මය. (...............)

23) නාට්‍ය පෙළෙහි වන සිද්ධි දාමය අපූර්වතම චලන ඇති කරමින් නාට්‍ය කෙරේ ප්‍රේක්ෂකයා ඇඩිව රඳවා තබා ගැනීම සඳහා මූලික වශයෙන් ඉවහල් වන්නේ,

i. විසටනයයි.

ii. රංග වින්‍යාසයයි.

iii. කතා ශරීරයයි.

iv. ගැටුමයි.

v. තාලයයි. (...............)

24) දක්ෂ නළුවෙකු සතු අත්‍යවශ්‍ය සාධකයකි,

i. නළුවාගේ උස.

ii. නළුවාගේ පැහැය.

iii. නළුවාගේ කටහඬ.

iv. නළුවා පොහොසත් ද යන වග.

v. නිදහස් පුද්ගලයෙක් ද යන වග. (...............)

25) සොෆොක්ලීස්ගේ ඛේදාන්ත නාට්‍ය නිර්මාණ දෙකකි,

i. ඇන්ටිගනී හා යෙර්මා.

ii. ඇන්ටිගනී හා සිතේටියන් කඳුවැටිය.

iii. ඉක්නෙව්ටා ඉ හා ඊඩිපස් රජ

iv. පොමිතියන් බන්ධනය හා ඔතෙලෝ.

v. ඇන්ටිගනි හා ඊඩිපස් රජ නාට්‍යය. (...............)

26) රංග භූමිය හැඳින්වීම සඳහා භාවිතා වන පොදු නාමයන් වන්නේ,

i. ස්කිනිය, ග්ලෝබ්, ප්‍රොසීනියම්.

ii. ප්‍රේක්ෂකාගාරය, රඟහල.

iii. රංගපීඨය, රඟ මඬල, කරළිය හා වේදිකාව.

iv. පසුතලය, වෘත්තාකාර වේදිකාව.

v. අනුෂාංගික අංග සහිත භූමිය. (...............)

27) නෘත්‍ය යනු,

i. ආංගික අභිනය පමණක් භාවිත කෙරෙන නර්තනයකි.
ii. රිද්මයක්, අර්ථයක්, මනෝභාවයක් සහිත නර්තනයකි.
iii. නෘත්ත යනු පදයට අරුත් දෙන්නකි.
iv. නර්තන කුසලාවයකි.
v. නාට්‍ය කලාවට අදාළ නොවන්නකි. (...............)

28) නෘත, නෘත්‍ය හා නාට්‍ය යන්නට නිදොස් ප්‍රකාශය වනුයේ,

i. පෙරදිග බිහි වූ සංකල්පයකි.
ii. අංගත්‍රයම සතර අභිනය මඟින් ඉදිරිපත් කෙරේ.
iii. අංගත්‍රයම මුද්‍රා නාට්‍ය කෙරෙහි යොදා ගැනේ.
iv. බටහිරින් පෙරදිගට සංක්‍රමණය වූ සංකල්පයකි.
v. වචන තුනම නෘත් ධාතුවෙන් සෑදී ඇත. (...............)

29) දැනට හමු වී ඇති එකම සම්පූර්ණ සටුර නාටකය වන්නේ,

i. දික්වු ටෝල්ඩ්කෝයි ය.
ii. ඉක්නෙව්ටායි ය.
iii. බෝයි ගොරොයිය.
iv. තුක් ලෝපසය.
v. ඇන්ටිගනී ය.

(...............)

30) නාට්‍ය ධර්මී නාටකයක ලක්ෂණයක් වන්නේ,

i. ආත්ම භාෂණවලින් තොර වීම.
ii. වේදිකා සැරසිලි බහුල වීම.
iii. චතුර් අභිනය අවම වශයෙන් යොදා ගැනීම.
iv. නාට්‍යමය අවස්ථා තාක්ෂණය භාවිතයෙන් වඩා තීව්‍ර කිරීම.
v. වේදිකා සැරසිලිවලින් තොර බව හා කාව්‍යමය බස් වහර. (...............)

31) සටුර නාට්‍යයක් සඳහා නොගැළපෙන ප්‍රකාශය වන්නේ,

i. ට්‍රැජඩි තුනක් හා එක් සැටර් නාට්‍යයක් රචනා කළ යුතුය.
ii. සටුර යන්ගෙන් සමන්විත ගායනා වෘන්දයකින් යුක්ත විය.
iii. රචනා කරන ලද්දේ commedy නාට්‍ය රචකයා විසින්ම ය.
iv. ප්‍රේක්ෂකයන්ට හාස්‍ය රසය ලබා දීමේ අරමුණින් රඟ දක්වයි.
v. නාට්‍ය උළෙලවල් වලදී රඟ දක්වන ලදී. (...............)

32) ගැටුම පිළිබඳ සදොස් ප්‍රකාශය වනුයේ,

i. ගැටුමක් නැති තැන නාට්‍යයක් නැතැයි යනු බර්නාට් ෂෝගේ ප්‍රකාශයකි.
ii. ගැටුම නාට්‍යයක් තුළ ගැබ් විය යුතු අනිවාර්ය අංගයකි.
iii. ගැටුම නාට්‍යයක් තුළ ගැබ් විය යුතු අනිවාර්ය අංගයක් නොවේ.
iv. ගැටුමක් නිරාකරණය වන අවස්ථාවක් බිංදු නමින් හඳුන්වයි.
v. බාහිර අභ්‍යන්තර වශයෙන් ගැටුම් අවස්ථා දෙයාකාර වේ. (...............)

- **අංක 33 , 34 ප්‍රශ්නවලට නොගැළපෙන පිළිතුර තෝරන්න.**

33) පහත දැක්වෙන ප්‍රකාශය අතුරින් කලාවට අදාළ ප්‍රකාශ 03 ඇතුළත් වරණය තෝරන්න.

A. කලාව දැනුමට හා බුද්ධියට ගෝචර නොවන්නකි.

B. රසිකයා පිනවන අපූර්වත්වයෙන් යුත් සෞන්දර්යාත්මක නිර්මාණයකි.

C. කලා කෞශල්‍යය නෛසර්ගික දායාදයකි.

D. පුරුදු පුහුණු කළ යුතු ශිල්පයක් නොවේ.

E. මිනිසා විසින්ම නිර්මාණය කරනු ලබන්නකි.

i. BCE ii. ABC iii. EDC iv. ADE v. BCD (...............)

34) ග්‍රීක නාට්‍යය කලාවට අදාළ නොවන වරණය,

i. සියලුම ග්‍රීක නාට්‍ය ප්‍රභේද 03 කට වෙන්කොට දැක්විය හැකිය.
ii. දැනට ලැබී ඇති සියලුම ග්‍රීක නාට්‍ය රචකයන් 05 කුට අයත්ය.
iii. සියලුම ග්‍රීක නාට්‍ය රචනා වී ඇත්තේ පද්‍යයෙනි.
iv. නාට්‍ය රඟ දක්වන ලද්දේ රාත්‍රී කාලයේය.
v. අර්ථපති හඳුන්වනු ලැබුවේ බොටිගොස් යනුවෙනි. (...............)

35) ග්‍රීක නාට්‍යයක අතිශය වැදගත් අභිනය වන්නේ,

i. වාචිකාභිනය.
ii. ආංගිකාභිනය.
iii. සාත්විකාභිනය.
iv. ආහාර්යා අභිනය.
v. අභිරූපණය. (...............)

36) ග්‍රීක නාට්‍යයේ ''කැතෑසීස් කරණය'' යනු,

i. භය හා කරුණාව මුල්කොට ගෙන සිත නිදහස් කර ගැනීමෙන් ඇති වන සහන ශීලී බව.
ii. නාට්‍ය රසය.
iii. පරිකල්පන රසය.
iv. රසවින්දනය තුළින් ලබන ජීවිතායබෝධය හා සතුට.
v. සමාජ යථාර්ථය සමඟ සිටීම. (...............)

37) පහත දැක්වෙන නාට්‍ය අතුරින් පැරණිතම කෘතිය වන්නේ,

i. රසවාහිණිය.
ii. නන්දිකේශ්වරගේ අභිතය දර්පණය.
iii. ධනංජය දසරූපය.
iv. භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රය.
v. ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රය. (...............)

38) නාට්‍යය පෙළක ස්වභාවයට නොගැළපෙන පිළිතුර වන්නේ,

i. සිද්ධි තර්කානුකූලව පෙළ ගැස්වීම.

ii. සියලු සිද්ධි කාලානුරූපීව ගොඩනඟා තිබීම.

iii. නාට්‍යමය ගුණයෙන් යුත් සිද්ධීන්වලින් ගහන වීම.

iv. සංවාද මඟින් වස්තුව ගොඩනැඟීම.

v. රංග විධාන ඇතුලත්ව තිබීම. (...............)

39) රංග භූමි තාක්ෂණය යනු,

i. වේදිකාව මත හැකිතරම් යන්ත්‍රෝපකරණ භාවිතයයි.

ii. වේදිකාව තනා ගැනීමේ ශිල්පයයි.

iii. වේදිකාව මත නාට්‍යයෙන් නිරූපණය වන අවස්ථා වඩාත් තීව්‍ර හා චමත්කාර කිරීමට තාක්ෂණය භාවිතා කිරීමයි.

iv. ශබ්දය මැනවින් ශ්‍රවණය වීම සඳහා උපකරණ භාවිත කිරීමයි.

v. නාට්‍යයේ භාවිතා කෙරෙන වේදිකා මෙවෙලම් ආදිය භාවිත කිරීමේ තාක්ෂණයයි.

(...............)

40) රූපණයේ සාර්ථකත්වයට අත්‍යවශයෙන්ම පුහුණු කළ යුත්තේ,

i. හඬ අභ්‍යාසය.

ii. සාත්වික අභිනය.

iii. සංවාද මතක තබා ගැනීමය.

iv. ශිතිල කරණ සන්නිවේදන හඬ හා පරිකල්පණ අභ්‍යාසයන්ය.

v. සංවාද මතක තබා ගැනීමය.

(...............)

## II කොටස

- A හා B කොටස්වලින් ප්‍රශ්න 02 බැගින් තෝරා ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

A කොටස

1)

i. ප්‍රාසාංගික කලාව යන්න පහදන්න. (ල. 04)

ii. නාට්‍ය කලාව හැරුණු කොට ඔබ කැමති වෙනත් ප්‍රාසාංගික කලා 02 ක් සඳහන් කොට ඒ දෙක අතර මූලික වෙනස්කම් පැහැදිලි කරන්න. (ල. 05)

iii. නාට්‍ය කලාව ප්‍රාසාංගික කලාවන් අතරින් සුවිශේෂී වන්නේ ඇයි දැයි පහදන්න. (ල. 06)

2)

i. නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී යන්නෙහි අර්ථය පහදන්න.

ii. ඕනෑම නාට්‍යයක අඩු වැඩි වශයෙන් මෙකී ලක්ෂණ අඩංගු ශෛලීන් දෙකක් නාට්‍ය 02 බැගින් උදාහරණ ගෙන විස්තර කරන්න.

iii. නාට්‍ය ධර්මී රංග ශෛලියෙහි පසුතල නිර්මාණ භාවිතය පිළිබඳව විමසීමක් කරන්න.

3)

i. ඊඩිපස් නාට්‍යයට පසුබිම වූ පුරාණ කථාව සැකවින් දක්වන්න.

ii. ත්‍රිවිධ ඒකීයත්වය ඊඩිපස් නාට්‍යයේ රැඳී ඇති ආකාරය නිදසුන් සහිතව පහදන්න.

iii. ඊඩිපස් රජ නාට්‍යයේ ඊඩිපස් දෛවය ලුහු බඳිනු ලබන නායකයකු ලෙස හැඳින්වීම කොතෙක් දුරට යුක්ති සහගත දැයි විමසන්න.

B කොටස

4)

i. අභිනය යන්න අර්ථකථනය කොට හඳුන්වන්න.

ii. ක්ෂණික නිරූපණය, භූමිකා නිරූපණය, අභිරූපණය යන්න වෙන වෙනම පහදන්න.

iii. දක්ෂ රූපණ ශිල්පියෙකු සතු ගුණාංග පිළිබඳ විමසීමක් කරන්න.

5)

i. නාට්‍ය පෙළ යනු කුමක්ද?

ii. නාට්‍යයක් සඳහා නාට්‍ය පිටපතක් තෝරා ගැනීමේදී අධ්‍යක්ෂකවරයා සැලකිල්ලට ගත යුතු කරුණු කවරේද?

iii. තෝරාගත් පිටපත නාට්‍ය නිර්මාණයක් බවට පත් කිරීමේ දී ඔහු අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග?

6)

i. ප්‍රේක්ෂකයා යන්න අර්ථකථනය කරන්න.

ii. හොඳ නාට්‍ය විචාරකයෙකු සතුවිය යුතු ගුණාංග කවරේද?

iii. ඔබ නරඹා ඇති නාට්‍ය දර්ශනවලින් උදාහරණ දක්වමින් නාට්‍ය නිෂ්පාදනයක් යොමු වන්නේ කවර කරුණු කෙරෙහි දැයි සාකච්ඡා කරන්න.